32 වන පිටෙන්

කරන්නට සමත් වුණා. ජාතික සමාජවාදය ලෙසින් කරළියට ආවත් නට්සිව ාදීන් ලෝකයේ ජාතිකත්වයන් පවා දූරාවලිය කට ලක්කළා. ඇඩොල්ෆ් හිට්ලර්ට අනුව ආර්යයන් හා අනාර්යයන් ලෙස මිනිසුන් වර්ග දෙකක් සිටිනවා.
ජර්මානු ජාතිය උසස්ම ජාතිය ලෙස තමයි නට්සිවාදීන් පිළිගත්තේ. අනෙකුත් උතුරු යුරෝපීය නෝඩික් ජාතීන්ද පිරිසිදු ආර්යයන් ලෙස තමයි ඔවුන් සැලකුවේ. බ්‍රිතාන්‍යය දෙවැනි ලෝක යුද්ධයට අවතිර්ණවනවාට මුල්කාලයේ හිට්ලර්ගේ නොපමනාපයක් තිබුණා. ඔහු බ්‍රිතාන්‍ය අගමැති චර්චිල්ට මේ බව ඉඟි කළා. නට්සිවාදීන් රුසියානුවන් සැලකුවේ පහත් ජාතියක් ලෙස.
කොහොම නමුත් හිට්ලර්ගේ වඩාත්ම අකමැත්ත තිබුණේ යුදෙව් ජාතීන් වෙත. ඔහු යුදෙව්වන් පිළිකුල් කළා. ඔහුගේ මතය අනුව යුදෙව්වන් යනු ආර්යයන්ගේ උත්තරීතරබව ආක්‍රමණය කිරීමට පැමිණි ආර්ය වේශයෙන් සිටින පිළිකුල් ජනවර්ග යක්. ඒ නිසා හිට්ලර් යුදෙව්වන්ට වෛර කළා. 1945දී දෙවැනි ලෝක යුද්ධය නිමා වනවිට යුරෝපයේ යුදෙව්වන් මිලියන 6ක් නාසි හමුදා විසින් ඝාතනයකර තිබුණා. Holocaust යනුවෙන් හැඳින්වූ මේ සමූල ඝාතන යාන්ත්‍රණයේ අරමුණ වුණේ යුදෙව්ව න් ලෝකයෙන් අතුගා දැමීමයි. යුදෙව්වන්ට එරෙහි එම Antisemitism ආකල්පය අදත් අළු යට ගිනි පුපුරු මෙන් සුදු අන්තවාදීන්ගේ සිත් තුළ තිබෙනවා.
සෝවියට් රුසියාවේ මූලිකත්වයෙන් ගොඩනැගුණු කොමියුනිස්ට් අධිරාජ්‍ය හේතුවෙන් යම් ආකාරයකින් මේ අන්තවාදී මතවාදයන් පැතිරීම අඩුවුණා. එයට ලෝකයේ බළකඳවුරු දෙකක් ඇතිවීමත් හේතුවුණා. පීඩිත ජාතීන්ට විකල්පයක් තිබුණා. ලෝකය වෙලාගෙන තිබෙන ආගමික අන්තවාදය පවා ඒ යුගයේ පාලනය වුණා. අද ඉස්ලාම් අන්තවාදය හේතුවෙන් අපායක් වී ඇති ඇෆ්ගනිස්තානයේ පවා තිබුණේ දැඩි එහෙත් සාමකාමී කොමියුනිස්ට් පාලනයක්. සෝවියට් සංගමය බිඳ වැටීමත් සමගම ඒ හිස්තැන ලබා ගැනීමට ඉදිරිපත් වූවන් අතර චීනය පෙරමුණ ගත්තා. තනි ලෝක බලවතා බවට පත්වූ ඇමෙරිකාවේ ඊශ්‍රායලය පිළිබඳ ප්‍රතිපත්තියත්, අරාබික රයේ තෙල් සම්පත කෙරෙහි දැක්වූ බටහිර ආකර්ෂණයත් හේතුවෙන් මැදපෙරදිග අස්ථාවර වුණා. එම කලාපයේ ඇමෙරිකානු මැදිහත්වීම්වලට විරෝධය දැක්වූ සදාම් හුසේන්, හොස්නි මුබාරක්, ගඩාෆි ආදී ප්‍රබල නායකයන් ඇමෙරිකාව සමග ගැටුම් ඇති කර ගත්තා. මැදපෙරදිග ස්ථාවරත්වයට



ප්‍රබල දායකත්වයක් සැපයූ අරාබි නායකය න් බලයෙන් පහවී ම්ලේච්ඡ ලෙස ඝාතනය වුණා. ස්ථාවර පාලනයක් නැති එම කලාපය මුස්ලිම් අන්තවාදයට තෝතැන්නක් වුණා. ඒ සමගම ව්‍යාප්ත වූ ජිහාඩ් ත්‍රස්තවාදය අද ලෝකයේ යහපැවැත්මට ප්‍රබල තර්ජණය ක්ව පවතිනවා. අල්කයිඩා, තලේබාන්, ෂීෂී ආදී ඉස්ලාම් අන්තවාදී ත්‍රස්තවාදී සංවිධාන පිළිකාවක් මෙන් ලෝකය පුරා ව්‍යාප්ත වෙමින් තිබෙනවා. ක්‍රයිස්ට්චර්ච් ප්‍රහාරයන් එල්ල වුණේ මුස්ලිම් දේවස්ථාන දෙකක සිකුරාදා යාඥා මෙහෙයන් අතරතුරයි. තවද, මෙය ආගමික ස්ථාන වෙත එල්ල වූ පළමු ප්‍රහාරයත් නෙවෙයි. ඉස්ලාම් ආගමේම විවිධ නිකායන් අතර දැඩි මතභේද තිබෙනවා. සුන්නි හා සියා මුස්ලිම් කොටස් අතර සංහිඳියාවක් නැහැ. ඊට අමතරව අහමඩියා ආදී කුඩා ඉස්ලාම් ජන කොටස් නිතර පීඩනයට පත්වෙනවා. වර්ෂ 2010 දී පාකිස්තායේ ලාහෝර්හි අහමඩියා දේවස්ථා නයකට එල්ල කළ තලේබාන් ප්‍රහාරයකින් බැතිමතුන් 87 දෙනෙකු මියගියා. ලෝකය පුරා කතෝලික දේවස්ථානවලටත් බොහෝ ප්‍රහාරයන් එල්ල වී තිබෙනවා. ඒවා සියල්ල ඉස්ලාම් ත්‍රස්ත වාදී සංවිධානවල ගිණුමට බැරව තිබෙනවා.

නවසීලන්තය, නෙදර්ලන්තය ආදී රටවලට මෙවැනි ලේ වැගිරීම් දරාගන්න බැහැ. අනෙත් අතට ඔවුන් අප මෙන් දරුණු අපරාධවලින් නිර්වින්දනය වෙලත් නැහැ. ආගමික අන්තවාදයක් ගෑවී නොතිබුණත් අප රට ද බොහෝ කලක් ත්‍රස්තවාදයෙන් බැටකෑවා. සමහර ආගමික ස්ථානවලට ම්ලේච්ඡ ප්‍රහාරයන් එල්ල වුණා. 1990දී කාත්තන්කුඩි මුස්ලිම් පල්ලියේ යාඥා කරමි න් සිටි 147ක පිරිසක් LTTE වූ වෙඩි ප්‍රහාරයන්ගෙන් මියගියා. 1985 දී අනුරාධපුර ශ්‍රී මහා බෝධි මළුවේ වෙඩි තැබීමකින් බෞද්ධ වන්දනාකරුවන් 146ක් මියගියා. වඩාත්ම අනුවේදනීය සිදුවීම වුණේ අරන්තලාවේදී. වන්දනාවක යමින් සිටි බෞද්ධ භික්ෂූන් 33 නමක් ත්‍රස්තවාදීන් විසින් කපා කොටා ඝාතනය කළා. එයින් වැඩි පිරිසක් කුඩා සාමනේර හිමිවරුන්. ලෝක බෞද්ධ ප්‍රජාවගේ මුදුන් මල්කඩවන මහනුවර ශ්‍රී දළදා මාලිගයට මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයක් එල්ල වුණා. අප පැමිණියේ එවැනි අවාසනාවන්ත යුගයක් පසු කරන්. නමුත් එවැනි අමිහිරි අත්දැකීම් තුළින් උගත හැකි පාඩම් මත ගොඩනැගෙන දියුණු දේශපාලන ශිෂ්ටා චාරයක් ගොඩනැගීම කෙරෙහි අප රටේ බොහෝ අංශ නොසැලකිල්ලක් දක්වන බවත් කිව යුතුයි.නවසීලන්තයට දීර්ඝ ඉතිහාසයක් නැහැ. නමුත් ඔවුන් දියුණු මානවවාදී ප්‍රතිපත්ති මත ගොඩනැගුණු නූතන ජාතියක්. එහි වර්ගවාදයට, ආගම්ව ාදයට ඉඩක් නැහැ. එම ප්‍රතිපත්ති රාජ්‍යේ සියලූම අංශ වෙත විහිදී පවතිනවා. එරට අග්‍රාමාත්‍ය ජසින්දා ආර්ඩන් මේ අර්බුදයේදී ක්‍රියා කළ ආකාරය එරට වැසියන්ගේ මෙන්ම ජාත්‍යන්තර වශයෙන් ද ප්‍රසාදය පළ වෙමින් තිබෙනවා. ඇය පැවසුවේ එය නවසීලන්ත ඉතිහාසයේ අඳුරුතම දිනය බවයි.

''ප්‍රහාරයෙන් වැඩිම බලපෑමක් සංක්‍රමණික වැසියන්ට සිදුව ඇති අතර නවසීලන්තය ඔවුන්ගේ නිවහන වනවා'' ට්විටර් පණිවුඩයක් මගින් ඇය වැඩිදුරටත් පවසා සිටියා. ජනතාවගේ ආරක්ෂාව උදෙසා දැනට පවතින ගිනිඅවි නීති කඩිනමින් වෙනස් කරන බවත් ඇය පවසනවා. ඇය මාධ්‍ය හමුවේ බොහෝ සෙයින් සංවේදී වුණා. ඝාතනය වූවන්ගේ පවුල් හමුවට ඇය පැමිණියේ මුස්ලිම් කාන්තාවන් මෙන් හිජාබ් ඇඳුමකින් සැරසී හිස පර්දාවකින් වසාගෙන. ඇය දෙවැනි වතාවටවත් ක්‍රයිස්ට්චර්ච් නගරයට 20වැනි දා පැමිණුනා. අගමැතිනිය අපරාධකාරුවාගේ නම කීම පවා ප්‍රතික්ෂේපකර තිබෙනවා. මේ අතර ඝාතකයා විසින් සජීවීව අන්තර්ජාලයට මුදාහරින ලද ඉතා සංවේදී හා සංවේගජනක වීඩියෝව ප්‍රචාරයට ඉඩදීම පිළිබඳව ෆෙස්බුක්, ට්විටර් ආදී සමාජ මාධ්‍ය ආයතනවලට චෝදනා එල්ල වෙනවා. ෆෙස්බුක් හරහා විකාශය වූ සජීවී වීඩියෝව 200කටත් වඩා අඩුවාර සංඛ්‍යාව ක් නරඹා ඇති බවත් කිසිවකු ඒ පිළිබඳව වාර්තා නොකරන ලද බවත් ෆෙස්බුක් ආයතනය නිවේදනය කරනවා. මිනිත්තු 17ක කාලයක් ගත් එම සජීවී වීඩියෝව නිමා වී මිනිත්තු 12කට පසු නවසීලන්ත පොලිසිය ඒ පිළිබඳව දැනුම්දුන් බවත් ඊළග මිනිත්තුවේ එය වහාම ඉවත් කළ බවත් ෆෙස්බුක් ආයතනය පවසනවා. කෙසේ නමුත් එම මුල් වීඩියෝව ඉවත් කිරීමටට පෙර වාර 4000ක් පමණ නරඹා ඇති බව වාර්තා වෙනවා. කෙසේ නමුත් අන්තර්ජාලයට එක්කොට තිබූ අදාළ වීඩියෝවේ දර්ශන මිලියන 1.5ක් ප්‍රහාරය සිදු වී පැය 24 ක් තුළ ඉවත් කළ බව ෆෙස්බුක් ආයතනය පසුව පැවසුවා.
මේ සංවේදී වීඩියෝව ප්‍රචාරය නොකරන මෙන් නවසීලන්තය ලෝකයේ සියලූම මාධ්‍යන්ගෙන් ඉල්ලා සිටියා. එය මුලින් විකාශය කළ බොහෝ මාධ්‍ය ආයතන පසුව සමාව ඉල්ලා සිටියා. ෂීෂී ත්‍රස්තවාදීන් විසින් සිරකරුවන්ගේ ගෙල කැපීම පටිගත කර අන්තර්ජාලයට මුදා හැරීම මගින් ඔවුන් තම විරුද්ධවාදීන්ට යම් පණිවුඩයක් ලබාදුන්නා. නමුත් බෙන්ටන්ගේ මේ සජීවී වීඩියෝව ඔහු යොමුකළේ තම අනුගාමිකයන්ටයි. එයින් ඔවුන් කෙරෙහි යම් උද්දීපනයක් ඇති කිරීමට ඔහු උත්සාහ දරා ඇති බවක් පෙනී යනවා. එය ෂීෂී ප්‍රචාරණයන්ට වඩා තැතිගැන්වෙන සුළු ප්‍රචාරණ ප්‍රවණතාවක් වනු ඇති බවට සැක මතුවී තිබෙනවා.

ඉවක් බවක් නැතිව ලේ රහට ලොල් කරන මෙරට සමහර විද්‍යුත් මාධ්‍යයන්ට නම් ඒ වීඩියෝව කටගැස්මක් වූ බවක් පෙනීගියා. උදේ සිට ?වන තුරු මාධ්‍ය කරුවන් ලෙස හංවඩු ගසා ගත් කොල්ලෝකුරුට්ටන් ?නක් යොදවා වොයිස් කට් එකතු කරන මේ මාධ්‍ය ආයතනවලට ජාත්‍යන්තර ප්‍රමිතීන් වැඩක්ම නැහැ. මනුස්සකමත් ප්‍රචාරණ උපක්‍රමයක් කරගත් එවැනි මාධ්‍ය ඇත්ත මිනිස් වටිනාකම් කුමක්දැයි අවබෝධ කරගෙන නැහැ. නමුත් මුලින්ම කියූ පරිදි සමාජ මාධ්‍ය භාවිත කරන්නන් ඇතිකරගත් ශික්ෂණය ඊට වඩා ප්‍රශස්ත මට්ටමක තිබුණ බවද කිව යුතුයි. ''අපට වස කවා හිතේ ඇති නවසීලන්තය සතුටින් ඉන්න'' යනුවෙන් තම ෆෙස්බුක් ගිණුමේ සටහනක් තබමින් කුරිරු ආස්වාදයක් ලැබූ ප්‍රමුඛ පෙළේ දේශ පාලන මාධ්‍ය ඔස්තාර්වරයකුට අම්ම මෝ නැතිව අහගන්නට සිදුවීමත් ඊට සමාන්තර වම සිදුවුණා. 2011 සැප්තැම්බර් 11 ඇමෙරිකාවට එල්ල වූ අල්කයිඩා ප්‍රහාරයෙන් ත්‍රස්තවාදය සම්බන්ධයෙන් ලෝකයේ මතය වෙනස්වුණා. එසේම මෙම ක්‍රයිස්ට්චර්ච් සංහාරයත් මානව වර්ගයාට නැවත වරක් නැවතී සිතන්නට සිදුවන සං ධිස්ථානයක් වී තිබෙනවා. ආගම් මුවාවෙන් අනෙකා පීඩාවට පත්කරන අන්තවාදීන් සැමවිටම සිතන්නේ ඒ කැපකිරීම වෙනුවෙන් ශාස්තෘවරුන් තමාට ස්වර්ගයේ දොරටුහැර බලාසිටින බව. ආගම්වාදය හෝ වර්ගවාදය කරපින්නා ගත් රටවල් වළපල්ලට යද්දී එය ප්‍රතික්ෂේපකර එකම ජාතියක් ලෙස නැගී සිටින නවසීලන්තය වැනි රටවල් ලෝකයේ තවත් තිබෙනවා. ඔවුන් ජනවාර්ගික විවිධත්වය සම්පතක් ලෙස සලකනවා. රටක් ලෙස අපට ද ලැබී ඇති ඒ විවිධත්වයේ අපූර්වත්වය රැගෙන අනාගතයට පියමං කිරීමට හැකිනම් එය තමයි අපේ සංහිඳියාව හා සංවර්ධනය.

Cartoon By Shanika Somatilake




